**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය - 2014**

**-----------------------------------------------**

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

**---------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මතය ව්‍යාචනය**

**------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**------------------------------------------**

**2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන**

**------------------------------**

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මණ්ඩලයට පූර්ණ හිමිකාරිත්වය ඇති පරිපාලිත සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර පිළියෙල කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළයුතු නමුත්, මණ්ඩලය වෙනුවෙන් පමණක් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් රු.130,696,928ක ප්‍රාග්ධන සංචිත හා රු.44,529,422 ක අයහාර සංචිත පවත්වා ගෙන යාමට හේතු හා ඒවායේ ස්වභාවය පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

(ii) මණ්ඩලයේ ක්‍රියාත්මක කිරි ව්‍යාපෘතිය, ඩිලයිට් ව්‍යාපෘතිය, වරලත් අලෙවිසැල්, ප්‍රධාන අලෙවිසැල, නේවාසිකාගාර, සංචාරක බංගලා සහ පුහුණු මධ්‍යස්ථාන යන උප ව්‍යාපෘති යටතේ ආදායම රු 265,368,361 ක් හා එයට අදාල වියදම රු. 114,226,085ක් වෙන වෙනම දක්වනවා වෙනුවට ශුද්ධ ප්‍රතිඵලය පමණක් ආදායම් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07

මෙහෙයුම්, මූල්‍ය හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ නිසි පරිදි වර්ගකර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08

සමාලෝචිත වර්ෂයේදී හඳුනාගත් පූර්ව වර්ෂ 03 ක සිදුවී තිබුණු වැරදීම්, අතීතානුයෝගීව මූල්‍ය ප්‍රකාශන තුළ ගලපා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයට ගත යුතු වුවද, රු. 13,231,640 ක්වූ හර ශේෂ හා රු.31,291,718 ක්වූ බැර ශේෂ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය මඟින් ගලපා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12

මණ්ඩලය විසින් විලම්භිත ආදායම් බදු වත්කම් හෝ වගකීම් පවතිනවාද යන්න හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වත්කමක් ප්‍රයෝජනවත් තත්ත්වයට පත්කළ අවස්ථාවේ සිට එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් ක්ෂය කළයුතු නමුත් එයට පටහැනිව 2012 හා 2013 වර්ෂවලදී අත්පත් කරගත් පිළිවෙලින් රු.635,064,057 ක් හා රු.80,468,192 ක් වටිනා වත්කම් සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කර තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ක්ෂය හා සමුච්චිත ක්ෂය වැඩියෙන් දක්වා තිබුණි.

(ii) යම් වත්කම් කාණ්ඩයක් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම් කාණ්ඩයට අයත් සියළු වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, මණ්ඩලය විසින් වාහන ප්‍රත්‍යාගණනය කිරීමේදී පිරිවැය රු. 60,960,579 ක් වූ වාහන 226 ක් අත්හැර තිබූ බැවින් ඒ මගින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම් විගණනයේදී අනාවරණය කරගත නොහැකි විය.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 17

-----------------------------------

බාහිර පාර්ශවයන්ට මෙහෙයුම් කල්බදු පදනමට ඉඩම් ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලද රු.720,259 ක ආදායම සම්බන්ධයෙන් කල්බදු ලබාදුන් ඉඩම් අක්කර ප්‍රමාණය, වටිනාකම, කාලවකවානු යන කරුණු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40

-----------------------------------

මූල්‍ය ප්‍රකාශන වල වෙනත් ආදායම් යටතේ කල්බදු ආදායම රු.1,720,763 ක් ලෙස දක්වා තිබුණු අතර, එය ඉඩම් අක්කර 520 ක් හා ගොඩනැගිලි කල්බදු පදනම මත බදු දීම මත ලබන ආදායමක් බැවින් ආයෝජන දේපල යටතේ ගිණුම්ගත කර සටහන් මගින් අනාවරණය කළයුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41

-----------------------------------

ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් හෙළිදරව් කළ යුතු ක්ෂයවීම්, ලද රාජ්‍ය ප්‍රදාන, කාලපරිච්ඡේදයට අදාලව වත්කම් වල එකතුකිරීම්, ඉවත්කිරීම් ආදී භෞතික හා මූල්‍ය තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. තවද ආනයනික ජීව විද්‍යාත්මක වත්කම් ලෙස 2012 හා 2013 වර්ෂයන් තුළදී මිලදී ගෙන තිබු පිළිවෙලින් රු.207,898,980 ක් හා රු.434,235,312 ක් වූ ගවයන් වර්ෂ අවසානයේ දී ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගයට ගිණුම් වලට ගැලපිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය දක්වාම ඒ අනුව ක්ෂය ගැලපීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම්ගත නොකරන ලද ඉකුත් වර්ෂ තුළදී බාහිර පාර්ශවයන්ගෙන් ලැබී තිබූ වාහන 6 ක් සමාලෝචිත වර්ෂයේදී රු.3,750,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණි. මෙම වත්කම ප්‍රදානයක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට, ප්‍රත්‍යාගණන ලාභයක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) 2012 වර්ෂයේ රු.171,900 කට මිලදී ගත් යතුරු පැදියක වටිනාකම අයභාර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.80,000 කට ප්‍රත්‍යාගණනය කර එම මුළු වටිනාකම ප්‍රත්‍යාගණන ලාභයක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී රු.641,900 කට මිලදී ගත් යතුරු පැදි 05 ක වටිනාකම වත්කමක් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට අත්තිකාරම් යටතේ ගිණුම්ගත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී එම වාහන රු.470,000 කට ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම ලාභයක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දෝෂ සහගතව දක්වා තිබුණි.

(ඈ) අමාත්‍යවරයා හා රේඛීය අමාත්‍යාංශය වෙනුවෙන් වැය කළ රු.1,644,023 ක වියදමක් ලැබිය යුතු ලෙස ගිණුම්වල දැක්වීම වෙනුවට මණ්ඩලයේ වියදම් ලෙස දක්වා තිබුණි.

(ඉ) 2009 වර්ෂයේ ඩයගම ගොවිපලේ වසු පැටව් විකිණීම වෙනුවෙන් ලද රු.435,680 ක අත්තිකාරම් හා මාරවිල ගොවිපලේ කුකුල් පැටව් විකිණීම වෙනුවෙන් ලද රු.3,113,782 ක අත්තිකාරම් අදාල විකිණීම් සිදු කිරීමේදී පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) භෞතික තොග සමීක්ෂණ වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිපල පොල් තොග ශේෂය රු.6,012,680 ක් වුවද ශේෂ පත්‍රයේ රු.6,478,070 ක් ලෙස දැක්වීම නිසා වෙළඳ හා අනෙකුත් තොග ශේෂය රු. 465,390 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් ලේඛනයෙන් ඉවත් නොකළ රු.131,673,719 ක් වටිනා වතු උපකරණ වත්කම් 1,077 ක්, කාර්යාල උපකරණ 1,156 ක් හා ආකෘතීන් 1,170 ක් ප්‍රයෝජනයට ගත හැකිදැයි පරීක්ෂාකොට වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 නොසැසඳු පාලන ගිණුම්**

-----------------------------

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය,ඊට අයත් ගොවිපලවල් හා ව්‍යාපෘති අතර ගණුදෙනු සටහන් කිරීම සඳහා අනුගමනය කරනු ලබන ගිණුම් ක්‍රමයේ ඇතුළත් ජංගම ගිණුම්, මුදල් හුවමාරු ගිණුම හා පාලන ගිණුම් අදාල එක් එක් ගිණුම් සමඟ සැසඳුම් කර ගැලපීම් නොකිරීම හේතුවෙන් වර්ෂ අවසානයේදී හර ශේෂ 369 ක එකතුව වු රු.1,206,961,029 ක් හා බැර ශේෂ 247 ක එකතුව වු රු.1,230,952,559 ක් අතර වෙනස වු රු. 23,991,530 ක් කෙටි කාලීන ණය ගැතියෝ යටතේ දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණයේ දී පහත කරුණු වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(අ) අන්තර් ගොවිපලවල ගණුදෙනු සටහන් කිරීමෙන් පසු ප්‍රධාන කාර්යාලයේ සහ එක් එක් ගොවිපල වල අන්තර් ගොවිපලවල ජංගම ගිණුම් ශුන්‍ය විය යුතු නමුත්, සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන කාර්යාලයේ අන්තර් ගොවිපලවල ජංගම ගිණුම්හි රු.370,676,659 ක හර ශේෂයක් හා රු.24,622,189 ක බැර ශේෂයක්ද, ගොවිපල පොත් වල අන්තර් ගොවිපලවල ජංගම ගිණුම්හි රු.2,584,523 ක හර ශේෂයක් හා රු.342,654,632 ක බැර ශේෂයක්ද, පැවතුණි.

(ආ) ප්‍රධාන කාර්යාලය හා ගොවිපලවල් අතර ගණුදෙනු වර්ෂ අවසානයට සැසඳීම් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුම් හි රු.715,770,651 ක හර ශේෂයක් හා ගොවිපල ජංගම ගිණුම්හි රු.716,534,893 ක බැර ශේෂයක් පැවතුණි.

(ඇ) ව්‍යාපෘති අතර මුදල් හුවමාරු කිරීම නිවැරදිව සටහන් නොකිරීම හා ගිණුම් සැසඳීම් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.11,199,993 ක හර ශේෂයක් හා රු.1,530 ක බැර ශේෂයක් මුදල් හුවමාරු ගිණුම් වල පැවතුණි.

(ඈ) ප්‍රධාන කාර්යාල හා ව්‍යාපෘති අතර මුදල් හුවමාරු කිරීම, මුදල් හුවමාරු ගිණුම් මඟින් සිදු කරන අතර, එම ගිණුම් ශේෂ දෙසැම්බර් 31 දිනට සැසඳීම් කිරීම සිදුකළ යුතු වුවත්, නියැදි විගණන පරීක්ෂාවේදී නොසැසඳුණු පහත සඳහන් ශේෂයන් අනාවරණය විය.

| | **ප්‍රධාන කාර්යාලයේ පොත් වල අදාල ව්‍යාපෘති නමට මුදල් හුවමාරු ගිණුම** | **අදාල ව්‍යාපෘතියේ පොත් වල ප්‍රධාන කාර්යාලය නමට මුදල් හුවමාරු ගිණුම** |
|---|---|---|
| | රු. | රු. |
| අලෙවි හල ෆැරන්චයිස් (franchise) ව්‍යාපෘතිය | 652,659 (හර)<br>2,707,775 (බැර) | 581,508 (බැර)<br>7,172,875 (හර) |
| Maize , Delite, Milk ව්‍යාපෘති | 27,313,344 (බැර) | ශේෂයක් නොමැත. |

(ඉ) ව්‍යාපෘති අතර මුදල් නොවන ගණුදෙණු සටහන් කිරීමට පාලන ගිණුම් පවත්වාගෙන යන අතර, ප්‍රධාන කාර්යාල පොත් අනුව ව්‍යාපෘති 7 කට අදාල ශුද්ධ ශේෂය රු.8,727,668 ක් (බැර) වුවද ව්‍යාපෘති ගිණුම් අනුව එය රු. 17,666,134 ක් වූ බැර ශේෂ 4 ක් විය. ව්‍යාපෘති අතර ඇතිවූ ගණුදෙනු එකිනෙකට නිරවුල් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් අන්තර් ව්‍යාපෘති ගිණුම් අතර රු.29,019,192 ක හර ශේෂ 4ක් හා රු.13,085,534 ක බැර ශේෂ 7ක්ද තවදුරටත් පැවතුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් අයිතම් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | ගිණුම් අයිතමය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් මිලදී ගැනීම හා අලුත්වැඩියාවන් | 20,565,165 | අදාල ලිපිගොනු |
| (ආ) | ණයගැතියෝ | | |
| | (i) මහවැලි පශු සම්පත් සංවර්ධන සමාගම | 2,750,000 | ගෙවීමට අදාල ලිඛිත සාක්ෂි හා ශේෂ සනාථ කිරීම්. |
| | (ii) රේඛීය අමාත්‍යාංශයෙන් -ගංවතුර සහනාධාර | 1,135,000 | - එම - |
| | (iii) වැවිලි නිවාස භාර අරමුදල සඳහා ගෙවීම් | 2,957,521 | - එම - |
| | (iv) රේඛීය අමාත්‍යාංශයෙන් - කුකුළු පැටවුන් ලබාදීම | 5,303,391 | - එම - |
| | (v) කන්තලේ ලංකා බැංකු ශාඛාවෙන් අයවියයුතු - 2009 වර්ෂයේ සිට පැවත එන ශේෂය | 2,092,750 | බැංකුව සමඟ ඇති කරගත් ගිවිසුම් |

(ඇ) මණ්ඩලයේ ගිණුම් සමඟ ඒකාබද්ධ කර දක්වන ලද ගොවිපලවල් 32 කට අදාල ලෙජරය, මූලික පොත් හා මූලාශ්‍ර ලියවිලි කිසිවක් විගණනය සඳහා ලැබී නොතිබුණි.

(ඈ) විදේශ බැංකු ණය මත ක්‍රියාත්මක වෙලාඩි එළගව ව්‍යාපෘතිය මගින් 2013 වර්ෂයේදී වැය කර මැණික් පාළම ගොවිපල යටතේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කරන ලද රු 80,604,253 ක් සමාලෝචිත වර්ෂයේදී අයභාර වියදමක් ලෙස සමුච්චිත ආදායමට කපාහැර තිබුණි. මෙම වියදම අයභාර වියදමක් ලෙස ලියා හැරීමට හේතුන් සහ එම වියදම තහවුරු කිරීමට අදාල කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවිය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුකුළු පැටව් ලබාදීම වෙනුවෙන් මහවැලි පශු සම්පත් සංවර්ධන සමාගමෙන් අයවිය යුතු වර්ෂ 05 ක් පැරණි රු.9,450,181 ක, රේඛීය අමාත්‍යාංශයෙන් අයවිය යුතු වර්ෂ 04 ක් පැරණි රු.5,303,391 ක සහ 2013 වර්ෂයේ මිය ගිය ආනයනික එළගවයින් 69 කට අදාලව රක්ෂණ සමාගමින් අයවිය යුතු රු.18,704,920 ක රක්ෂණ වන්දි අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ආ) රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයකින් හා ව්‍යාපෘතියකින් අයවියයුතු රු.3,237,187 ක ණය ශේෂයක් වසර 4 ක කාලයක් ඉක්මවා තිබුණද අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඇ) කාර්ය මණ්ඩල ණයගැති ශේෂ තුල වර්ෂ 04 කට වඩා පැරණි රු.1,037,889 ක ශේෂය අයකර ගැනීමට නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක වී නොතිබුණු අතර, ණයහිමි ශේෂ තුල පැවති වර්ෂ 01 කට වඩා පැරණි ඉල්ලුම් නොකරන ලද වැටුප් හා කොමිස් පිළිවෙළින් රු.260,782 ක හා රු.182,472 ක ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ගොවිපලවල් 2 ක වසර 5ට වඩා පැරණි නිරවුල් කර නොමැති රු.103,833 ක සේවක අර්ථසාධක අධිභාර පැවතීමට හේතු අනාවරණය කරගෙන එය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ලංකා කම්කරු සංගමයෙන් රොසිටා ගොවිපලට අයවියයුතුව පැවති වසර 2 කට වඩා පැරණි රු.364,554 ක ණය ශේෂයක් තිබියදී සමාලෝචිත වර්ෂයේදීද රු.413,929 ක් වටිනා ගොවිපළ නිෂ්පාදන ණයට සපයා තිබුණි.

(ඊ) 1992 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයෙන් ලබා ගෙන තිබුණු රු.50,000,000 ක පොළී රහිත ණය මුදල 2015 අගෝස්තු 31 දින දක්වා නිරවුල් කර නොතිබුණු අතර, එම ණය මුදල පියවීම සඳහා ඉදිරි වැඩපිළිවෙලක් හෝ සකස්කර නොතිබුණි.

(උ) වටිනාකම රු.1,600,799,758 ක්වූ ණය මුදල සඳහා 2012, 2013 හා 2014 වර්ෂ වෙනුවෙන් එකතුව රු.52,956,140 ක පොලී මුදලක් මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රු.12,000,000 ක් පමණක් ආපසු ගෙවා තිබුණි. 2013 මාර්තු 08 දිනට පෙර හෝ එදින සිට ණය ආපසු ගෙවීම ආරම්භ කළයුතු බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දන්වා තිබු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණ අතර ණය මුදල ආපසු ගෙවීමේ සැලැස්මක් සකස්කර ගැනීමට හෝ මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | ------------------------------------- | ------------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 102 (1) හා 103 | කිරි ව්‍යාපෘතියට අදාළව 2012 වර්ෂයේදී හඳුනාගන්නා ලද රු.10,239,389 ක තොග ඌනතාවය සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වන වගන්තිය | හොරකැලේ ගොවිපලේ ස්ථිර සේවකයින් 23 දෙනෙකුගේ සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ගණනය කිරීම සඳහා සේවකයින්ගේ මුළු ඉපයීම් වෙනුවට මූලික වැටුප පමණක් යොදා ගෙන තිබීම නිසා දායක මුදල රු.633,571 ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. |
| (ඇ) | 2007 අගෝස්තු 24 දිනැති අංක 9 / 2007 (1) ඕ දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (i) හා (iv) ඡේද | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී වයස අවුරුදු 60 ඉක්මවූ තැනැත්තෙකු උපදේශකවරයෙකු ලෙස කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන මාසයකට රු. 53,225ක් බැගින් රු.106,450 ක දීමනා ගෙවා තිබුණි. |
| (ඈ) | 2011 සැප්තැම්බර් 15 දිනැති අංක පීඊඩී 58(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සභාපතිවරයාට 2013 දෙසැම්බර් සිට 2014 දෙසැම්බර් දක්වා මාසයකට රු.30,000 ක් බැගින් ගෙවල් කුලී දීමනා වශයෙන් එකතුව රු.390,000 ක් ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.60,309,530 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.86,084,563 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.146,394,093 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පරිපාලන වියදම්, මූල්‍ය වියදම් හා වෙනත් වියදම් පිළිවෙලින් රු.38,600,252 කින්, රු. 13,430,699 කින් හා රු.11,851,114 කින් වැඩි වී වෙනත් ආදායම් රු.24,637,326 කින් අඩු වී තිබුණ ද, දළ ආදායම හා රජය ප්‍රදාන පිළිවෙලින් රු.204,560,599 කින් හා රු.29,710,365 කින් වැඩි වීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

තවද ඉකුත් වර්ෂයේ ගිණුම් මගින් ඉදිරිපත් කළ රු.2,096,836 ක අතිරික්තයට එම වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කරන ලද රු.80,604,253 ක් සමාලෝචිත වර්ෂයේදී අයභාර වියදමක් ලෙස ගැලපුම් කර ඉකුත් වර්ෂයේ ලාභය සංශෝධනය කිරීම හේතුවෙන් ඌනතාවය රු.86,084,563 ක් ලෙස සන්සන්දනාත්මකව දක්වා තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විකුණුම් ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් බාහිර ආයතන තුනකට එරෙහිව මණ්ඩලය විසින් රු.14,360,075 ක් ඉල්ලා 2011 හා 2012 වර්ෂවලදී අධිකරණවල නඩු දෙකක් ගොනුකර තිබුණු අතර, මණ්ඩලයේ සේවකයින් 10 දෙනෙකු විසින් සේවය

අත්හිටුවීමට විරුද්ධව 2001 සිට 2014 දක්වා කාලය තුල මණ්ඩලයට එරෙහිව නඩු 10 ක් ගොනුකර තිබුණි.

(ආ) විකිණීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත ලබාදී තිබුණු බඩ ඉරිඟු වෙනුවෙන් වූ මුදල් මණ්ඩලයට නොගෙවීම නිසා අයවිය යුතු රු.11,194,220 ක් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇති නමුත්, 2015 අගෝස්තු 30 දින වන විටද එම මුදල් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ප්‍රධාන කාර්යාලය හා මණ්ඩලයේ පවත්නා ව්‍යාපෘති 4 ක් සඳහා කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් පවත්වාගෙන යන ගොවිපල 32 අතරින් 17 ක් සමාලෝචිත වර්ෂයේදී රු. 152,387,111 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණු අතර, එයින් ගොවිපල 07 ක් 2008 වර්ෂයේ සිටම අලාභ ලබමින් පැවතුණි. කෙසේ වුවද මෙම ගොවිපලවල් ලාභ ලබන තත්ත්වයට පත්කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඇ) කිරි ව්‍යාපෘතිය යටතේ කිරි අලෙවි කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය මගින් පවත්වා ගෙන ගිය අලෙවි සැල් 69 කින් වර්ෂය තුලදී එකතුව රු. 635,475 ක අලාභයක් ලැබු අලෙවිසැල් 15ක් හා රු.12,600 ක ලාභයක් ලබා ඇති එක් අලෙවි සැලක්ද සමාලෝචිත වර්ෂය තුලදී වසා දමා ඇති අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අලෙවි සැල් 53ක් අතරින් 10 කින් රු1,196,478 ක අලාභයක් ද, 43 කින් රු.17,043,541 ක ලාභයක් ද ලබා තිබුණි. තවද මණ්ඩලයට අයත් මුළු වරලත් අලෙවිසැල් 111 ක් අතරින් අලෙවිසැල් 15 ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අතර, සමාලෝචිත වර්ෂයේදී එම අලෙවිසැල් 15 න් රු. 399,287 ක අලාභයක් ලබා තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොල් අලෙවිය සඳහා වූ තැරැව්කරුවන්ගෙන් අය විය යුතු සම්පූර්ණ ණය ශේෂය රු.12,893,012 ක්වු නමුත් රු.5,821,542 ක් අයකර ගැනීම සඳහා පමණක් නීතිමය පියවර ගෙන තිබුණු අතර වසර 05 ක් ඉක්මවු රු.4,555,949 ක ණයගැති ශේෂය අයකර ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) පාරිතෝෂිත ගෙවීම් ප්‍රමාද වීම නිසා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.251,450 ක මුදලක් අධිභාර ලෙස ගෙවා තිබුණි.

(ඇ) ගොවිපල නිවාසවල පදිංචි සේවකයින්ගෙන් කිසිදු කුලියක් අයකර නොතිබු අතර, විදුලිය හා ජලය පරිභෝජනය සඳහා ගාස්තු අයකිරීමට නිශ්චිත ක්‍රමවේදයක් නොමැති බැවින් සමහර පදිංචිකරුවන්ගෙන් ගාස්තු අයකරන අතර සමහර පදිංචිකරුවන්ගෙන් ගාස්තු අයනොකරන බව නියැදි පරීක්ෂණවලින් අනාවරණය විය.

(ඈ) ගොවිපල 4ක ඉඩම් අක්කර 187 ක් හා පර්චස් 24 ක් බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් අත්පත්කර ගෙන තිබුණු අතර, ඉන් අක්කර 151 ක්ම අත්පත්කර ගෙන ඇත්තේ 2013 හා 2014 වර්ෂවලදීය. මෙම ඉඩම් නැවත මණ්ඩලය වෙත අත්පත්කර ගැනීමට 2015 නොවැම්බර් 30 දින දක්වාම කළමනාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) ප්‍රත්‍යාගණිත වටිනාකම රු. 3,500,000 ක් වූ වාහන 04 ක් වර්ෂ 10 ක සිට භාවිතා කර තිබූ නමුත්, එහි අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය දක්වාම කටයුතු නොකොට සමාලෝචිත වර්ෂයේදී අවසන් ගිණුම් වලින් පමණක් ඉවත් කර තිබුණි.

(ඊ) මණ්ඩලයට අයත් ගොවිපලවල තිබෙන නිවාස 70ක සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(උ) 2015 ජූනි 16 දිනැති අංක අමප/15/0940/631/018 -1 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සීමාසහිත මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමෙහි සියලුම සම්පත්, වත්කම් සහ කොටස් කළමනාකාරීත්වය මණ්ඩලය වෙත පැවරීමට තීරණය කර තිබුණද, ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) පාලනමය අයිතිය මණ්ඩලය සතු වූ හෙක්ටයාර් 10,542.64 ක ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---

කන්තලේ උක් වගා භූමියේ අක්කර 1,000 ක ඉඩමක බඩඉරිගු ව්‍යාපෘතියක් වෙනුවෙන් චක්‍රීය අරමුදලක් ඇති කිරීමට නැගෙනහිර නවෝදය යටතේ 2007 ජූනි 28 දින මණ්ඩලය වෙත රු.මිලියන 37.55 ක් ලබා දී තිබුණි. එම ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් 2011 සැප්තැම්බර් 11 දින ඉඩම සීනි සමාගම වෙත පවරන අවස්ථාවේ බඩ ඉරිගු ව්‍යාපෘතිය යටතේ පැවති චක්‍රීය අරමුදලේ ඉතිරි මුදල් වන රු.17,549,342 ක් මහ බැංකුවේ අදහස් දැක්වීම් හා 2007 ජූනි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයට යොමු කළ යුතුව තිබුණද, එසේ සිදු නොකොට ඉන් රු.13,295,637 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු යටතේ තැන්පත් කර තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) 2013 වර්ෂයේදී මුද්‍රණය කරන ලද 2012 වර්ෂයට අදාල පිරිවැය රු.401,500 ක් වූ කාර්යසාධන වාර්තා 550 ක් වැලිසර ගොවිපල ගබඩාවෙහි ඉතිරිවී තිබුණි.

(ආ) සීමාසහිත ශ්‍රී ලංකා කුකුළු පාලන පුද්ගලික සංවර්ධන සමාගම සතුව තිබූ පර්කින්ස් වර්ගයේ ධාරිතාව 50 – 60 $H_Z$ ක් වූ විදුලි ජනක යන්ත්‍රයක් 2014 දෙසැම්බර් 16 දින රු.25,000 ක ප්‍රවාහන වියදමක් දරා වැලිසර ගොවිපල වෙත ගෙනවිත් තිබුණු අතර, විගණිත දිනය වූ 2015 අප්‍රේල් 23 දින දක්වාම එයින් කිසිදු ප්‍රයෝජනයක් ගෙන නොතිබුණි. මෙම විදුලි ජනක යන්ත්‍රය ගොවිපල වෙත ගෙන ඒමට හේතුව අනාවරණය නොවුණි.

(ඇ) මාස 6 සිට අවුරුදු 15 ක කාල පරතරයක් දක්වා කිසිවෙකු පදිංචිවී නොමැති නමුත් පදිංචියට සුදුසු නිවාස 145 ක් හා පදිංචියට නුසුදුසු නිවාස 110 ක් පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) 2005 වර්ෂයේ සිට හොරකැලේ ගොවිපල සතුව පැවති 2014 වර්ෂයේදී රු.800,000 ට නැවත අගයකරන ලද ලොරි රථයක් 2013 වර්ෂයේ පෙබරවාරි මාසයේ සිට 2015 අගෝස්තු 30 දක්වාම ගොවිපලේ අක්‍රියව පැවතුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

මණ්ඩලය විසින් 2003 වර්ෂයේදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් රු.102,662,750 ක ණය මුදලක් ලබා ගෙන තිබුණු අතර, එය වර්ෂ 11 ක් තිස්සේ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට මුළු පොලිය රු.87,757,178 ක් සමග ගෙවිය යුතු සම්පූර්ණ මුදල රු.181,369,878 ක් වී තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ කළමනාකරණ තනතුරු 22 ක් පුරප්පාඩුවී තිබුණු අතර, ඉන් තනතුරු 13ක්ම ගොවිපල කළමනාකරු තනතුරු වේ. තවද කළමනාකරණ සහකාර හා නුපුහුණු සේවකයින් 80 ක අතිරික්තයක් පැවතුණි.

(ආ) අනුමත බඳවා ගැනීමේ කාර්ය පරිපාටිය අනුව සහකාර කළමනාකරු (මූල්‍ය) තනතුරෙහි නිලධාරින් දෙදෙනෙකු සේවයෙහි නියුතුව සිටියදීත් සභාපතිගේ අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම මත ගණකාධිකාරිවරයෙකු 2014 නොවැම්බර් 17 දින මාස 03 ක කාලයක් සඳහා බඳවාගෙන තිබු අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙම නිලධාරියා සඳහා මසකට රු. 35,000 බැගින් දීමනාවක්ද ගෙවා තිබුණි.

(ඇ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මුදල් අයකැමි තනතුරක් සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට 458 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණු නමුත්, අනුමත කාර්ය මණ්ඩලයට මෙවැනි තනතුරක් ඇතුලත් කර නොතිබුණි.

(ඈ) බඳවා ගැනීමේ පරිපාටියෙහි දක්වා නොමැති සංචාරක බංගලා උපදේශක තනතුරක් වෙනුවෙන් කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු 2014 අප්‍රේල් 01 දින බඳවාගෙන මාසයකට රු.40,000 බැගින් මාස 05 ක් සඳහා දීමනා වශයෙන් රු.200,000 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2015 නොවැම්බර් 04 දිනදීය.

**5.2 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 , 5.1.3 වගන්ති හා 2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය හා අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සහිතව, මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපතිටද පිටපතක් සහිතව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළයුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම පදනම් කරගෙන ඉදිරි මුදල් වර්ෂයේ ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලය විසින් ගොවිපල 32 ක් සඳහා පමණක් ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කර තිබූ නමුත් මණ්ඩලයේ පවතින ව්‍යාපෘති හා මානව සම්පත් සංවර්ධන සැලැස්ම ඇතුලත් සමස්ත ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබුණු ගොවිපල 27 ක ව්‍යාපෘති 06 කට අදාල ක්‍රියාකාරකම් 61 ක භෞතික ප්‍රගතිය ශුන්‍ය අගයක් ද, ගොවිපල 19 ක ක්‍රියාකාරකම් 40 ක් යටතේ භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු අගයක් ද ගොවිපලවල් 12ක ක්‍රියාකාරකම් 15 ක ඉලක්කයන් කාර්යසාධන වාර්තාවට සටහන් කිරීමේදී ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු ඉලක්කයන්ට වඩා අඩුවෙන් දක්වා එම ඉලක්කයන් ද සම්පූර්ණ කර නොතිබුණි. තවද ගොවිපලවල් 31 ක ක්‍රියාකාරකම් 293 ක ප්‍රගතිය වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ඇතුලත් නොවූ බැවින් එම ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂයේ ඉටුකර තිබේද යන්න පරීක්ෂා කළ නොහැකි විය.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර විචලනයේ ප්‍රතිශතය සියයට 08 සිට සියයට 725 දක්වා වූ අතර, සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර නොතිබූ වැය විෂයයන් 24 ක් සඳහා රු.36,850,094 ක වියදමක් ප්‍රධාන කාර්යාලය හා ව්‍යාපෘති මඟින් දරා තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

**5.5 නොවිසඳී ඇති විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2001 වර්ෂයේදී රිදීයගම ගොවිපලෙන් අක්කර 150 ක් පුද්ගලයින් 98 දෙනෙකු විසින් අනවසර වගා කටයුතු සඳහා අත්පත් කරගෙන තිබුණු අතර, ඔවුන් ගොවිපලෙන් ඉවත් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ආ) මුදල් අඩුවීමක් ලෙස රු.53,363 ක මුදලක් කිරි ව්‍යාපෘතියේ ණයගැතියන් යටතේ දක්වා තිබුණද, ඊට හේතු අනාවරණය නොවීය.

(ඇ) ගංවතුර සහනාධාර ලෙස දෙන ලද රු.1,135,000 ක මුදල රොසිටා ගොවිපලෙන් අයවිය යුතු ණයගැති ශේෂයක් ලෙස ලෙජර ගිණුම් හි දක්වා තිබුණද, මෙම මුදල පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයෙන් අයකරගත යුතු ශේෂයක් බැවින් 2014 වර්ෂයේදී ද එම මුදල අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) මෙහෙයුම් කළමනාකරණය
(ඇ) මූල්‍ය කළමනාකරණය
(ඈ) අයවැය පාලනය
(ඉ) කාර්යමණ්ඩල පරිපාලනය